# ACCOUNTING CONCEPTS (Part-XIV)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# සංගතතා සංකල්පය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ පදනම්, සම්ප්‍රදායයන්, ප්‍රතිපත්තීන්, නිරන්තරයෙන් ම වෙනස් නොකළ යුතු බව සංගතතා සංකල්පයෙන් දැක් වේ.

මෙහිදී ඒකාකාරී බව අනුගමනය කිරීම නිසා පහත ආකාරයේ සන්සන්දනයක් කිරීමට හැකි වේ.

- ව්‍යාපාරයක ගිණුම්, එම ව්‍යාපාරයේ වසර කිහිපයක ගිණුම් සමග සන්සන්දනයට
- ව්‍යාපාරයක මූල්‍ය තොරතුරු සමාන වෙනත් ව්‍යාපාරයක මූල්‍ය තොරතුරු සමග සන්සන්දනයට

ClassWork.LK

# ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස් කළ හැකි අවස්ථා

ව්‍යාපාරයක් දිගින් දිගටම අනුගමනය කරමින් පැවති ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස් කළ හැකි අවස්ථා දෙකක් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි යන ප්‍රමිතිය මඟින් දක්වා ඇත.

- වෙනත් ගිණුම්කරණ ප්‍රමිතයක අවශ්‍යතාව මත
- ප්‍රතිපත්ති වෙනස් කිරීමෙන් මූල්‍ය ප්‍රකාශන වඩාත් සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන්නේ නම්

ClassWork.LK

## සංගතතා සංකල්පයේ යෙදීම් :

පෙර වර්ෂවල අනුගමනය කළ තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය වූ පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමය ම අදාළ ගිණුම් කාලච්ඡේදය තුළ දී ද අනුගමනය කිරීම.

ClassWork.LK

## අභ්‍යාස

(01) සංගතතා සංකල්පය පැහැදිලි කරන්න.

(02) සංගතතා සංකල්පයේ ප්‍රයෝජන පැහැදිලි කරන්න.

(03) සංගතතා සංකල්පය යෙදෙන අවස්ථාවක් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

ClassWork.LK

(04) පහත ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ වඩාත් උචිත ගිණුම්කරණ සංකල්ප හෝ සංකල්ප ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

| ගනුදෙනුව / සිද්ධිය | සංකල්පය / සංකල්ප |
|---|---|
| ණයගැතියන් සඳහා 5% ක අඩමාන ණය වෙන් කිරීම. | ........................................ |
| මූල්‍ය කල්බදු ක්‍රමයට අත්පත් කර ගත් යන්ත්‍රයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇත. | . ........................................ |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන වශයෙන් වර්ග කර ඇත. | ........................................ |
| ගෙවිය යුතු වියදම් හා ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිළිවෙලින් ජංගම වගකීම් ලෙසත් ජංගම වත්කම් ලෙසත් දක්වා ඇත. | ........................................ |
| ණයගැතියන්ගෙන් රු. 2 000 ක් බොල් ණය ලෙස කපා හැර එය වියදමක් සේ හඳුනා ගැනීම. | |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2016. 03. 31 දිනට යනුවෙන් ඉහළින් සඳහන් කිරීම. | ........................................ |
| තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට සටහන් කිරීම. | ........................................ |
| සිල්වා ට්‍රේඩර්ස්' නමින් මූල්‍ය ප්‍රකාශන ඉහළින් ව්‍යාපාරයේ නම දැක්වීම. | ........................................ |
| වසර 5කට පෙර මිල දී ගත් රු. 500,000 ක ඉඩම ප්‍රවර්තන වර්ෂයේදී ත්, රු. 500,000 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණනයකර දැක්වීම. | ........................................ |
| දේපළ, පිරියත හා උපකරණ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කිරීම. | ........................................ |

ClassWork.LK

(05)

# පුන්සදා ව්‍යාපාරය (A)

## (B) 2017. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(C) (රු. දහස්)

| | (D) රු. පිරිවැය | රු. සංක්ෂය | රු. ශුද්ධ අගය |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** (E) | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 5 000 | 1 800 | 3 200 |
| මෝටර් රථ | 3 000 | (M) 900 | 2 100 |
| යන්ත්‍ර උපකරණ | 2 000 | 400 | 1 600 |
| | 10 000 | 3 100 | 6 000 |
| **ජංගම වත්කම්** (F) | | | |
| (G) තොග | | 1 300 | |
| වෙළඳ ණයගැතියෝ | | 2 000 | |
| (H) ඉදිරියට ගෙවූ කඩකුලී | | 300 | |
| මුදල් | | 2 400 | 6 000 |
| මුලු වත්කම් | | | 12 000 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| (I) 2016. 04. 01 ප්‍රාග්ධනය | | 6 000 | |
| (J) එකතු කළා : ශුද්ධ ලාභය | | 1 400 | 7 400 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය (වර්ෂ 3 කින් ගෙවිය යුතු) | | 2 000 | |
| (K) කල්බදු ණය හිමියෝ | | 600 | 2 600 |
| **ජංගම වගකීම්** | | | |
| බැංකු ණය - ජංගම කොටස | | 1 000 | |
| කල් බදු ණය - ජංගම කොටස | | 300 | |
| වෙළෙඳ ණය හිමියෝ | | 1 200 | |
| (L) උපචිත විදුලිය ගාස්තු | | 400 | 2 900 |
| | | | 12 000 |

ClassWork.LK

තොගවල පිරිවැය රු. 1 500 000 වූ අතර ශුද්ධ උපලබ්ධි අගය රු. 1 300 000 කි.

තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය FIFO ක්‍රමය අඛණ්ඩ ව භාවිත කිරීම

ඉහත සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇති ගිණුම්කරණ සංකල්ප කවරක් ද යන්න පහත දක්වෙන ඉංග්‍රීසි අකුරුවලින් ඉදිරිපත් කරන්න.

A : ..................................
B : ..................................
C : ..................................
D : ..................................
E : ..................................
F : ..................................
G : ..................................
H : ..................................
I : ..................................
J : ..................................
K : ..................................
L : ..................................
M : ..................................

ClassWork.LK

(06) පහත ප්‍රකාශන හරි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න.

| | |
|---|---|
| 01. ගිණුම්කරණයේ දී ව්‍යාපාරික ගනුදෙනු හා සිද්ධීන් ව්‍යාපාරයේ පොත්වල වාර්තා කිරීමේ දී ව්‍යාපාරයට අයිතිකරුගෙන් වෙන් වූ ස්වාධීන පැවැත්මක් ඇතැයි සැලකේ. | |
| 02. ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු හා සිද්ධීන් අතුරෙන් මුදලින් මැනිය හැකි ගනුදෙනු හා සිද්ධීන් පමණක් හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරයි. | |
| 03. ව්‍යාපාරය දැකිය හැකි අනාගතයක් දක්වා පවතී යන උපකල්පනය කර මූල්‍ය වාර්තා පිළියෙල කරයි. | |
| 04. ව්‍යාපාරයේ අඛණ්ඩ වූ ජීව කාලය කාලච්ඡේද වශයෙන් බෙදා එක් එක් කාලච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි. | |
| 05. ගණනය කිරීමේ දී කාලච්ඡේදයට අදාළ සියළු ආදායම් මුදලින් ලැබුණත් ඇතත්, නැතත්, ආදායම් ලෙස ද, කාලච්ඡේදයට අදාළ සියළු වියදම් මුදලින් ගෙවා තිබුණොත් පමණක් වියදම් ලෙස ද සටහන් කෙරේ. | |

ClassWork.LK

(07) පහත හිස්තැන්වලට අදාළ සංකල්පය දක්වන්න.

ව්‍යපාරිකයා සිය පුද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ලබා ගන්නා බඩු. තොග, ගැනිලි වශයෙන් සටහන් කරනුයේ .......................................... සංකල්පය පදනම් වේ.

මුදලින් මැනිය හැකි ගනුදෙනු පමණක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන්නේ ...................... අනවු ය.

ව්‍යාපාරයක වත්කම් හා වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කරනුයේ ...................... සංකල්පය අනුව වේ.

ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ .............................. සංකල්පය අනුව ය.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura